

# අතර මං වූ බූලා

ර්. එම්. ඒ. ජී. හිමාෂා සඳමිණී ඒකනායක
මහ/මහමායා බාලිකා විදුහල

# අතරමං වූ බූලා

කතාව හා චිත්‍ර

ආර්.එම්.ඒ. ජී. හිමාෂා සඳමිණි ඒකනායක
මහ/මහාමායා බාලිකා විදුහල
2 A

ISBN -978-624-208-008-6

# පිදුම

සිප් සයුරේ කිමිදෙන්නට

මඟ හසර කියා දුන්

ගුරු මෑණිවරුන්ටත්

සෙවනැල්ලක් සේ මා ළඟින් සිටින

ආදරණීය

දෙමාපියන්ටත්

මේ සඳහා මඟ පෙන්වූ සැමටත්

මාගේ මේ කුළුදුල් පොත

බැතියෙන් පුදමි.

පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මග පෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථ කරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවක් සපුරාලීමකි. එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැළපෙන නවීකරණය කරමින් 'දිවිය දිනන විද්‍යුත් පොතක්' ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවනට අත්දැකීම සමුදායක් මෙන්ම ගත්කරුවෙකු වීම ද හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි. 2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ 'දිවිය දිනන විද්‍යුත් පොතක්' ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප කළමනාකාර මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල්වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන් ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

2023. 11. 01

වැස්ස දවසක උදෙන්ම මමයි, නංගියි පාසල් යන විට පාර අයිනේ චූටි බලු පැටියෙක් සීතලේ වෙවුලමින් සිටිනවා මම දැක්කා.



මම එයාව බලන්න ළඟට ගියත් නංගි මාව ඇදගෙන පාසල් ගියා. ඒත් එදා පාසලේ දී මට නිතරම අර බලු පැටියා මතක් වුණා.

පාසල් ඇරි මම දුවගෙන ආවා. බලු පැටියා සිටි තැන නතර වුණා .අනේ පව්.......!!!



බලු පැටියා එතන නිදි

මම දුවගෙන ගෙදර ගියා.

තාත්තා එක්කගෙන ආයෙත් බලු පැටියා සිටි තැනට ආවා.



අපි බලු පැටියා අරගෙන ගෙදර යමු කියලා මම තාත්තාට කිවුවා.

අම්මා බනියි කියලා තාත්තා බෑ කිවුවා.

ඒත් මගේ ඇවට්ල්ලට අපි බලු පැටියා ගෙදර ගෙනියලා උඟට බත් ටිකක් දුන්නා.

අනේ උඟ බත් ටික ඔක්කොම කෑවා.



අම්මා නම් අකමැති වුණත් අපි තාත්තාට කියලා පසු දින ඌට කූඩුවක් හදලා එයා තෙමෙන්නේ නැතිව තිබ්බා.



කූඩුවට දොරක් නම් දැම්මේ නැහැ. අනේ බලු පැටියා හරිම සතුටින්...

අපි එයාට “බූලා” කියලා නමක් දැම්මා



අපි කවදාවත් බූලා කූඩුවට දැම්මේ නැහැ. එයාට හිතුණු වෙලාවට කූඩුවට යනවා. ඒත් එයා කවදාවත් අපි දාලා ගියේ නම් නැහැ.



අපි පාසල් ඇරි එන විට බූලා අපි එක්කරගෙන යන්න මගට එනවා.

උදේටත් අපි පාසල් යන දෙස බලා ගෙන ඉන්නවා. අම්මාත් දැන් බූලාට හරිම ආදරෙයි.

මගේ බූලා....

දැන් අපේ බූලා වෙලා.....

පවුලේ සියලු දෙනාටම ආරක්ෂාව සපයන

බූලා සියළු දෙනාටම ආදරෙයි.

අපි සියළු දෙනාමත් බූලාට දැන් ආදරෙයි.

## පසු වදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයක් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දි මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලිකව යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩ නැගි ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන් ම සමාජයේ වගකිව යුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

'දිවිය දිනන විද්‍යුත් පොතක්' ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතිමු...

මෙයට

සෙනවිරත්තන මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023.11.01